# 5. ශ්‍රම වෙළෙඳපොල

2002 දෙවන භාගයේදී ආර්ථිකය අපේක්ෂිත ලෙස යථා තත්ත්වයට පත්වීම හේතුකොට නව ආර්ථික ක්‍රියාවලියන් ඇතිවීම මගින් 2001 දෙවන භාගයට වඩා රැකියා අවස්ථා ඇතිවිය හැක. 2001 දී පැවති දුර්වල ආර්ථික තත්වයන් හේතුකොටගෙන 2002 පළමු කාර්තුවේදී සියයට 8.7 ක උපරිමයක් දක්වා වැඩි වූ සේවා වියුක්ති අනුපාතිකය 2002 අවසානයේදී රැකියා අවස්ථා වැඩිවීම නිසා නැවතත් අඩුවීමේ ප්‍රවනතාවයක් පෙන්විය හැකි අතර, එම අනුපාතිකය 2002 සඳහා සියයට 8.5 ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

5.1 රූප සටහන
ආර්ථික ක්‍රියාකාරීත්වය අනුව සේවා නියුක්තිය




**ශ්‍රම බලකා සහභාගිත්වය**

- සේවා නියුක්තිය සහ සේවා වියුක්තියෙහි එකතුව වන ශ්‍රම බලකාය, 2001 පළමු කාර්තුවේ සිට 2002 පළමු කාර්තුව අවසානය දක්වා කාලච්ඡේදය තුලදී 565,000 කින් වැඩිවී මිලියන 7.3 ක් බවට පත්විණි. ශ්‍රම බලකායෙහි වැඩිවීම සේවා නියුක්තියෙහි 450,000 ක සහ සේවා වියුක්තියෙහි 115,000 ක වැඩිවීම මගින් පිළිබිඹු වේ.

- 2002 පළමු කාර්තුවේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ශ්‍රම බලකාය වයස අවු. 10 හා ඊට වැඩි කුටුම්භ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස) 2001 පළමු කාර්තුව සඳහා වූ සියයට 49.2 හා සසඳන විට සියයට 51.7 දක්වා වැඩිවිය. මෙම වැඩිවීමට ප්‍රධාන හේතුවක් ලෙස ආර්ථික පසුබෑමකට පසු ඇතිවන තත්ත්වයන් හා වැඩිවන ජීවන වියදම නිසා ආර්ථික ක්‍රියාවලියන්හි නිරතවීමට කැමති අයගේ පැහැදිලි වැඩිවීම සඳහන් කළ හැක.

- ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයෙහි වැඩිවීමෙහි වැදගත් ලක්ෂණයක් ලෙස පුරුෂ සහභාගිත්ව අනුපාතිකය හා සසඳන විට ස්ත්‍රී සහභාගිත්ව අනුපාතිකය ඊට වැඩි වේගයකින් ඉහලයාම සැළකිය හැක. පුරුෂ සහභාගිත්ව අනුපාතිකය 2001 පළමු කාර්තුවේ සියයට 66.8 සිට 2002 පළමු කාර්තුවේදී සියයට 67.9 දක්වා වැඩි වූ අතර එම කාලච්ඡේදය සඳහා වූ ස්ත්‍රී සහභාගිත්ව අනුපාතිකය සියයට 31.9 සිට සියයට 35.9 දක්වා වැඩි විය.

**රැකියා අවස්ථා**

- පෞද්ගලික අංශය රැකියා උත්පාදනයෙහි ප්‍රධාන මූලාශ්‍රය ලෙස තවදුරටත් පැවතුණ අතර රාජ්‍ය අංශයේ දයකත්වය තවදුරටත් පහත වැටුණි.

- සේවා නියුක්ත පුද්ගලයන් පුළුල් වශයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තිකයින්, සේව්‍යයන්, ස්වයං රැකියාලාභීන්

හා ගෙවීම් නොලබන පවුල් ශ්‍රමිකයන් යන කොටස් පහ අතුරින් පුද්ගලික අංශයේ සේවා නියුක්ති දායකත්වය 2001 පළමු කාර්තුවේදී සියයට 43.0 සිට 2002 පළමු කාර්තුවේදී සියයට 45.2 දක්වා වැඩි වී සේවා නියුක්තියෙහි වැඩිම දායකත්වය ලෙස තවදුරටත් පැවතිණි. රාජ්‍ය අංශයේ සේවා නියුක්ති දායකත්වය 2001 පළමු කාර්තුවේදී සියයට 14.7 සිට 2002 පළමු කාර්තුවේදී සියයට 12.7 දක්වා පහත වැටුණි.

- 2002 වර්ෂයේ කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය පැහැදිලි ලෙස ඉහල ගිය අතර, මේ සඳහා වී නිෂ්පාදනය වැඩිවීම හේතුකොට 2001 මහ කන්නයට සාපේක්ෂ 2002 මහ කන්නයේදී රැකියා අවස්ථා වැඩිවීම හේතු විය. කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්ති දායකත්වය සියයට 32.1 සිට සියයට 35.1 දක්වා 2001 පළමු කාර්තුව හා 2002 පළමු කාර්තුව අතර කාලච්ඡේදය තුලදී වැඩි විය.

- 2001 ට සාපේක්ෂ 2002 දි වාණිජ හා හෝටල් අංශයේ රැකියා උත්පාදනයෙහි දියුණුවක් දක්නට ලැබුණි. එහි දායකත්වය 2001 පළමු කාර්තුවේදී සියයට 13.2 සිට 2002 පළමු කාර්තුවේදී සියයට 14.6 දක්වා වැඩි විය.

5.2 රූප සටහන
ශ්‍රම බලකාය සහ විරැකියාවේ ප්‍රවණතාවය 1998-2003




## සේවා වියුක්තිය

- 1990 සහ 2000 අතර දස වසර තුලදී අඩු වූ සේවා වියුක්ති අනුපාතිකය, 2001 දුර්වල ආර්ථික ක්‍රියාකාරකම් වල හේතුවෙන් වැඩිවීමට පටන් ගැනින. ආර්ථිකය දුර්වලවීම කාල පමාවකින් පසුවද රැකියා උත්පාදනය කෙරෙහි ඇතිවන බලපෑම හේතුකොටගෙන 2002 දී ද, සේවා වියුක්තිය වැඩිවෙතැයි බලාපොරොත්තු වේ. 2000 වසරේදී සියයට 7.6 හා සසඳනවිට 2001 දී සියයට 7.9 ක් දක්වා වැඩි වූ සේවා වියුක්ති අනුපාතිකය 2002 පළමු කාර්තුවේදී සියයට 8.7 දක්වා වැඩි විය.

- 2001 පළමු කාර්තුව හා 2002 පළමු කාර්තුව අතර කාලච්ඡේදය තුලදී ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 11.7 සිට 12.8 දක්වා වැඩි වූ අතර, පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය ඊට වඩා වැඩි වේගයකින් සියයට 5.8 සිට සියයට 6.5 දක්වා වැඩි විය.

- අධ්‍යාපන සුදුසුකම් ඇති තරුණ-තරුණියන් අතර තවදුරටත් සේවා වියුක්තිය ඉහළ මට්ටමක පවතින බවට සාක්ෂි ලෙස අදළ කාලච්ජේය තුලදී වයස 15-19 දක්වා සහ 20-29 දක්වා වයස කාණ්ඩවල සේවා වියුක්ති අනුපාතිකය සියයට 18.9 සිට සියයට 22.9 දක්වා වැඩිවීම සහ අ.පො.ස.සාමාන්‍ය පෙල සහ අ.පො.ස. උසස් පෙල සමත් සහ ඊට වැඩි සුදුසුකම් ඇති අයගේ සේවා වියුක්ති අනුපාතිකය සියයට 12.0 සිට සියයට 16.7 දක්වා ඉහළයාම දැක්විය හැක.

- නිරන්තර ප්‍රශ්නයක් ලෙස සැළකෙන මෙම අධ්‍යාපන සුදුසුකම් ඇති තරුණ-තරුණියන් අතර සේවා වියුක්තිය සඳහා පිළියමක් ලෙස රැකිරක්ෂා සහ කම්කරු අමාත්‍යාංශය විසින් ජාතික රැකිරක්ෂා ප්‍රතිපත්තිය-2002 නමින් කෙටුම්පතක් සකස්කොට ඇත. මෙමගින් තරුණයන් හට දේශිය වශයෙන් පමණක් නොව අවශ්‍ය පුහුණුව සැපයීමෙන් පසු ජාත්‍යන්තර වශයෙන් ද රැකියා පහසුකම් ලබාදීමට බලාපොරොත්තු වේ.

- තවද, රැකිරක්ෂා සහ කම්කරු අමාත්‍යාංශය මගින් මුළු රටපුරාම පිහිටුවීමට යෝජිත රැකියා අවස්ථා සලසාදෙන කාර්යාල මගින් රැකියා සොයන පුද්ගලයන් හට පමණක් නොව රැකියා ලබාදෙන අයටද පහසුකම් සළසාදෙන ආයතනයක් ලෙස කටයුතු කරයි. පුද්ගලික අංශයෙහි තොරතුරු පමණක් නොව විදේශ රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු සැපයීම මගින් රැකියා ඉල්ලුම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ලබාදීමට අපේක්ෂිතයි.

### විදේශ රැකියා අවස්ථා

- 2002 පළමු භාගය තුලදී විදේශ සේවා නියුක්තියේ ක්‍රමවත් දියුණුවක් 2001 ට සාපේක්ෂව දක්නට ලැබුණු අතර, ඊට ප්‍රධාන හේතුව වූයේ 2001 ජුලි මාසයේ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට එල්ල කල ත්‍රස්ත ප්‍රහාරය නිසා ඇති වූ අහස් යානා ප්‍රමාණය සීමාවීම සහ ගුවන් ගමන්වල අඩුවීම වැනි සීමාවීම් නොමැතිවීමයි. මෙම ක්‍රමවත් දියුණුව සැළකිල්ලට ගැනීමෙන් පසු 2002 සඳහා අපේක්ෂිත විදේශ රැකියා නියුක්තිය 198,000 ක් වන අතර, සංසන්දනාත්මකව 2001 වසරේදී 184,000 ක් විය.

- විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව රැකියා සඳහා පිටත් වූ ප්‍රමාණය 2001 පළමු භාගයේදී 87,000 සමඟ සසඳනවිට 2002 පළමු භාගය තුලදී මඳ වශයෙන් වැඩි වූ අතර, එම ප්‍රමාණය 90,000 ක් පමණ විය. විදේශ රැකියා සඳහා බාධා රහිත ප්‍රවනතාවයක් බලාපොරොත්තු විය හැකි බැවින් 2002 දෙවන භාගය සඳහා විදේශ රැකියා උත්පාදනය 108,000 ක් පමණ වෙතැයි අපේක්ෂා කරන අතර, සංසන්දනාත්මකව 2001 දෙවන භාගයේදී 97,000 ක් විය. 2001 වර්ෂයේදී විදේශ සේවා නියුක්තිය පහල මට්ටමක පැවතිමට රටෙහි අභ්‍යන්තර හා බාහිරව ඇතිවූ අහිතකර සිදුවීම් බෙහෙවින් බලපාන ලදී.

5.3 රූප සටහන
විදේශ රැකියා අවස්ථා




- 2001 පළමු භාගයේදී ස්ත්‍රී විදේශ නියුක්තියේ ප්‍රතිශත දයකත්වය සුළු ප්‍රමාණයකින් අඩු වූ අතර, 2002 පළමු භාගයේදී සියයට 66 ක් විය. ගෘහ සේවිකාවන්ගේ ප්‍රතිශත දයකත්වය සියලූම ශ්‍රම කාණ්ඩ අතරින් තවදුරටත් වැඩිම අගයක් ගත් අතර, 2002 පළමු භාගය සඳහා සියයට 55 ක් විය.

### කම්කරු සම්බන්ධතා

- 2002 පළමු භාගය තුළදී පෞද්ගලික අංශයේ වැඩ වර්ජන 62 දක්වා වැඩි වූ අතර, සංසන්දනාත්මකව 2001 පළමු භාගයේදී වැඩ වර්ජන ගණන 49 ක් විය. වැඩ වර්ජන සඳහා සම්බන්ධ වූ සංඛ්‍යාව අඩු වුවද, අහිමි වූ මිනිස් දින ගණන 2001 පළමු භාගයේ 29,384 සිට 2002 පළමු භාගයේ 40,619 දක්වා වැඩි විය. 2002 පළමු භාගයේ පෞද්ගලික අංශයේ මුළු වැඩ වර්ජන සංඛ්‍යාවෙන් සියයට 28 ක් වතු අංශයට සම්බන්ධ වැඩ වර්ජන විය.

### ශ්‍රම වෙළෙඳපොල

- 1942 කර්මාන්තශාලා ආඥා පනතෙහි 68 වන වගන්තිය සංශෝධනය කිරීම ප්‍රතිසංස්කරණ ගණනාවක පලමු වැන්න වන අතර, ස්ත්‍රී සේවා නියුක්තයින්ගේ අතිකාල පැය වසරකට 100ක් දක්වා සීමාවී තිබූ අතර, එය සංශෝධනය කොට අගෝස්තු 6 වනද පාර්ලිමේන්තුවේ සම්මත කරගන්නා ලදී.

මෙම සංශෝධනය මගින් අතිකාල පැය මසකට 60 දක්වා ලිහිල් කරන ලදී. මෙම සංශෝධනය මගින් දැනටමත් අතිකාල පැය 100 හි සීමාව කඩකරන කර්මාන්තකරුවන්හට නීති ආවරණය ලබාදෙන අතර, මෙය විශේෂයෙන් ඇඟළුම් කර්මාන්තශාලා අංශයට අදල අවශ්‍යතාවයක් ලෙස සැලකිය හැක.

- 1950 කාර්මික ආරවුල් පණත ද ළඟදීම සංශෝධනය කෙරේ. මෙම සංශෝධනය මගින් කම්කරු විනිශ්චය සභාවට පොදු වන ප්‍රශ්නයක් විසඳීම දින 120 කින්ද (මාස 4) කම්කරු කොමසාරිස් ජනරාල් සහ ඔහුගේ නිලධාරීන් විසින් දෙපක්ෂය සමථයකට පත් කිරීමෙන් ආරවුල විසඳීම දින 60 කින්ද (මාස 2) කම්කරු කොමසාරිස් ජනරාල් වෙත යොමුවන සේවය අවසන් කිරීම් සම්බන්ධ දැන්වීමකින් පසු එයට අදළ කටයුතු අවසන් කිරීම දින 30 කින්ද (මාස 1) ඇතුලත නිම කිරීමට අත්‍යාවශ්‍ය බව අවධාරණය කෙරේ. මෙම සංශෝධනය 421 සංශෝධනය නමින් හැඳින්වේ.

- 1971 අංක 45 දරණ සේවය අවසන් කිරීම පණතෙහි සංශෝධන ලෙස ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා දැරිය යුතු වියදම ගණනය කිරීමට අත්‍යාවශ්‍ය වූ, පැහැදිලි ලෙස සඳහන් වූ ප්‍රතිලාභ ක්‍රමයක් සහ ප්‍රතිව්‍යුහගත කිරීම් මගින් රැකියා අහිමි වන්නනට රැකියා ලබාගැනීමට අවශ්‍ය ශක්තිමත් ආරක්ෂක දැලක් සම්පාදනය කිරීම හැඳින්විය හැක. මෙම ආරක්ෂක දැල මගින් රැකියා අහිමිවූවන්ට සෑම දිස්ත්‍රික්කයක් පාසාම ඉදි කිරීමට යෝජිත රැකියා මධ්‍යස්ථාන මගින් ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට සහ ශ්‍රම වෙළෙඳපොල අවශ්‍යතාවයන්ට සරිලන පුහුණුව සහ රැකියා පහසුකම් සැපයීමට බලාපොරොත්තු වේ. රැකියා අහිමිවූවන් සඳහා ප්‍රතිලාභ සැපයීම සඳහා පෞද්ගලික අංශයේද ආධාර ඇතිව රැකිරක්ෂා සහ කම්කරු අමාත්‍යාංශය මගින් අරමුදලක් ගොඩනැගීමට අපේක්ෂා කරන අතර, මෙය ආරක්ෂක දැලෙහි ප්‍රධාන අංගයක් වනු ඇත.